**ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය**

# පරීක්ෂක වාර්තාව

අදියර I විභාගය - 2022 ජූලි

## (104) ව්‍යාපාරික පරිසරය

(Business Environment)

---

**හැඳින්වීම:**

**අදියර 1 සඳහා නියමකර ඇති ව්‍යාපාරික පරිසරයේ සියළුම ක්ෂත්‍රයන් මෙම සමස්ත ප්‍රශ්න පත්‍රයෙන් ආවරණය කර ඇති බැවින් මෙහි අරමුණ වී ඇත්තේ විෂය ක්‍ෂේත්‍රය පිළිබඳ අයදුම්කරුවන්ගේ සමස්ත දැනුම පරීක්‍ෂාවට ලක් කිරීමය. සමස්තයක් ලෙස ගත් කළ බොහොමයක් අයදුම්කරුවන්ගේ කාර්යසාධනය සතුටුදායක වන අතර අයදුම්කරුවන් සුළු පිරිසක් හොඳින් උත්තර ලිවීමට අසමත් වී තිබුණි.**

පරීක්ෂකවරුන් විසින් ඉදිරිපත් කරන ලද කරුණු පහත පරිදි වේ:

## A - කොටස

### ප්‍රශ්න අංක 01

**මෙම කොටසින් ව්‍යාපාරික පරිසරය විෂයයේ සමස්ත විෂය කරුණක්ම ආවරණය කර තිබූ අතර අයදුකම්රුවන් සියළු දෙනාම වාගේ උත්තර සපයා තිබුණේය. ලකුණු 100 න් ලකුණු 40 ක් මේ සඳහා වෙන්කර තිබූ අතර අයදුම්කරුවන්ගෙන් බහුතරය ලකුණු 20 - 30 අතර උපයාගෙන තිබුණේය. බොහොමයක් අයදුම්කරුවන් ප්‍රශ්න අංක 1.5, 1.4 , 1.16 සහ 1.18 සඳහා සාර්ථක ලෙස උත්තර සපයා තිබුණේ නැත. ප්‍රශ්නෝත්තර පිළිබඳ නිරීක්‍ෂණ පහත දක්වා ඇත.**

**1.5** අයදුම්කරුවන් බහුතරය සීමිත හවුල් කරු පිළිබඳ දැන සිටියේ නැත. නිවැරදි උත්තරය වෙනුවට ඔවුන් සාමාන්‍ය හවුල්කරු තෝරාගෙන තිබුණි.

**1.14** අණලද්දන්ට චෙක්පතක සාමාන්‍ය රේඛණයක් සිදුකළ හැකි බව බොහොමයක් අයදුම්කරුවන් හඳුනාගෙන තිබුණේ නැත.

**1.16** බොහොමයක් අයදුම්කරුවන් මුදල් වෙළඳපොළ සහ ප්‍රාග්ධන වෙළඳපොළ අතර වෙනස දැනගෙන සිටියේ නැත. සමහර අයදුම්කරුවන් මුදල් වෙළඳපොළේ මුදල් පමණක් හුවමාරු කෙරෙන බව හා ප්‍රාග්ධන වෙළඳපොළේ ප්‍රාග්ධන භාණ්ඩ හුවමාරු කෙරෙන බව සඳහන් කර තිබුණි.

**1.18** බොහොමයක් අයදුම්කරුවන් විධිමත් සංවිධානයක් සහ අවිධිමත් සංවිධානයක් අතර වෙනස හඳුනා දක්වා තිබුණේ නැත. අයදුම්කරුවන්ගෙන් බහුතරය අවිනිශ්චිත උත්තර ලියා තිබුණි.

**කෙසේවුවද ඉහත ප්‍රශ්න හැර අයදුම්කරුවන් බොහොමයක් මෙම කොටසට සාර්ථක ලෙස උත්තර ලියා තිබුණේය.**

# B - කොටස

**මෙම කොටසෙහි අනිවාර්ය ප්‍රශ්න 04ක් විය. එක් ප්‍රශ්නයකට ලකුණු 10 බැගින් ලබාගත හැකිව තිබූ මුළු ලකුණු 40 කි.**

## ප්‍රශ්න අංක 02

ව්‍යාපාර සංවිධාන වර්ග මත මෙම ප්‍රශ්නය පදනම් වී තිබුණි.

**A කොටස** ඔවුන්ගේ ව්‍යාපාරය ආරම්භ කිරීමේදී **චින්තක** සහ **කිත්මිණ** විසින් සලකා බැලිය හැකි ව්‍යාපාර සංවිධාන වර්ග හඳුනා දැක්වීම අවශ්‍ය කර තිබිණි.

සැලකිය යුතු අයදුම්කරුවන් පිරිසක් මෙම කොටසට නිසි ලෙස උත්තර සපයා නොතිබුණු අතර හවුල් ව්‍යාපාර සහ බද්ධ ව්‍යාපාර වෙනුවට පුද්ගලික සමාගම් ලෙසද සඳහන් කර තිබුණි.

**B කොටස** ඉහත සඳහන් (හවුල් ව්‍යාපාර/බද්ධ ව්‍යාපාර) වල ලක්‍ෂණ පැහැදිලි කිරීම අවශ්‍ය කර තිබූ අතර අයදුකම්රුවන්ගෙන් බහුතරය මෙම ප්‍රශ්නයට හොඳින් උත්තර සපයා සම්පූර්ණ ලකුණු ලබා තිබුණේය.

**C කොටස** ඉහත කී ව්‍යාපාරික සංවිධානයේ අවාසි සඳහන් කිරීම අවශ්‍ය කර තිබූ අතර අයදුම්කරුවන් බොහොමයකට සතුටුදායක ලෙස උත්තර සපයා ලකුණු ලබා ගැනීමට හැකි විය.

## ප්‍රශ්න අංක 03

මුදල් සහ බැංකු පිළිබඳව අයදුම්කරුවන්ගේ දැනුම පරීක්‍ෂාවට ලක්කිරීම අපේක්‍ෂා කරන ලදී.

**A කොටස** ව්‍යාපාර සංවිධානයකට මුදල් වැදගත් වන්නේ කුමක් නිසා දැයි හේතු පැහැදිලි කරීම අපේක්‍ෂා කර ඇත. අයදුම්කරුවන්ගෙන් බහුතරය හොඳින් උත්තර ලියා සම්පූර්ණ ලකුණු ලබාගෙන ඇත. සමහර අයදුම්කරුවන් සාමාන්‍ය දැනුම භාවිත කර සාමාන්‍ය උත්තර ලියා තිබුණි. එම නිසා මෙම ප්‍රශ්නයට සම්පූර්ණ ලකුණු ලබා ගැනීමට නොහැකි වී ඇත.

**B කොටස** බහුතරය මෙම ප්‍රශ්නයට හොඳින් උත්තර ලියා සම්පූර්ණ ලකුණු ලබාගෙන තිබුණේය. ජංගම ගිණුම් හිමියෙකුට ඇති ප්‍රතිලාභ හඳුනා දැක්වීම අවශ්‍ය කරන ලදී.

**C කොටස** මතුදාතම චෙක්පත් හා විවෘත චෙක්පත් අතර වෙනස පැහැලි කිරීම අපේක්‍ෂා කරන ලදී. මතුදාතම චෙක්පතක් හා විවෘත චෙක්පතක් අතර වෙනස පැහැදිලි කිරීමට අපොහොසත් වූ නිසා බොහොමයක් අයදුම්කරුවන්ට සම්පූර්ණ ලකුණු ලබා ගැනීමට නොහැකි විය. අයදුම්කරුවන්ගෙන් බහුතරය තම සාමාන්‍ය දැනුමෙන් අවිනිශ්චිත උත්තර ලියා තිබුණේය.

## ප්‍රශ්න අංක 04

**A කොටස** අන්තර්ජාතික වෙළඳාමට පිවිසීමට ඇති හේතු විමසා ඇත. අන්තර්ජාතික වෙළඳාමට පිවිසීමට ප්‍රධාන හේතු අයදුම්කරුවන්ගෙන් බහුතරය වටහාගෙන සතුටුදායක මට්ටමේ ලකුණු ලබාගෙන තිබුණේය.

**B කොටස** **සීමාසහිත ගියර් සමාගම** ට ඔවුන්ගේ ව්‍යාපාර මෙහෙයුම් සිදුකිරීමේදී රජය විසින් සහය ලබා දෙන්නේ කෙසේදැයි නිවැරදිව වටහා ගත් අයදුම්කරුවන් බොහොමයක් ඒ ගැන සඳහන් කොට සම්පූර්ණ ලකුණු ලබාගෙන තිබූ අතර සමහරු මෙම කොටසට එම සාමාන්‍ය දැනුමෙන් උත්තර ලියා තිබුණේය.

**C කොටස** **සීමාසහිත ගියර් සමාගම** රටේ සංවර්ධනය සඳහා දායකවන්නේ කෙසේදැයි පැහැදිලි කිරිම අවශ්‍ය කර තිබුණේය. මෙම දායකවීම පැහැදිලි කිරීමට අපොහොසත් වීම නිසා අයදුම්කරුවන්ගෙන් බොහොමයකට සම්පූර්ණ ලකුණු ලබා ගැනීමට නොහැකි විය.

**කෙස්වෙතත් ඉහත ප්‍රශ්නය සඳහා සමස්ත කාර්යසාධනය සතුටුදායක වූ අතර අයදුම්කරුවන් බොහොමයකට සතුටුදායක ලකුණු ලබා ගත හැකි විය.**

## ප්‍රශ්න අංක 05

**A කොටස** හොඳ ප්‍රවාහන පද්ධතියක් භාවිත කිරීමෙන් ලබා ගත හැකි වාසි සඳහන් කිරිම අවශ්‍ය කර තිබුණි. බොහොමයක් අයදුම්කරුවන් හොඳ ප්‍රවාහන පද්ධතියක වාසි නිවැරදිව හඳුනා දක්වා සම්පූර්ණ ලකුණු ලබාගෙන තිබුණේය.

**B කොටස** ප්‍රවාහන පද්ධතියක මූලිකාංග එකිනෙක සඳහා උදාහරණයක් බැගින් දක්වමින් හඳුනා දැක්වීම අවශ්‍ය විය. බහුතරයක් අයදුම්කරුවන් මෙම කොටසට සාර්ථක ලෙස උත්තර ලියා නොතිබුණු අතර හොඳ ප්‍රවාහන පද්ධතියක මූලිකාංග වෙනුවට හොඳ ප්‍රවාහන පද්ධතියක ලක්ෂණ පැහැදිලි කර තිබුණි.

**C කොටස** විද්‍යුත් වෙළඳාමේ ජනප්‍රියතාවයට හේතු සඳහන් කිරීම අවශ්‍යකර තිබුණේය. අයදුම්කරුවන් බොහොමයක් විද්‍යුත් වෙළඳාමේ ජනප්‍රියතාවයට හේතු හඳුනා දක්වා සම්පූර්ණ ලකුණු ලබාගෙන තිබුණේය.

## C - කොටස

### ප්‍රශ්න අංක 06

මෙය **"රිච් කුකීස්"** නම් ආයතනය සම්බන්ධයෙන් වූ විෂය අධ්‍යයන පාදක කරගත් ප්‍රශ්නයකි. අයදුම්කරුවන් සියළු දෙනාම වාගේ මෙම ප්‍රශ්නයට උත්තර සපයා තිබූ අතර ඔවුන් අතුරෙන් බොහෝ දෙනෙකු සාධාරණ ලකුණු ප්‍රමාණයක් ලබාගෙන තිබුණේය.

**A කොටස** දී තිබුණු සංවිධානයේ අභ්‍යන්තර සහ බාහිර පරිසරය පැහැදිලි කිරීම අවශ්‍ය කර තිබුණි. අයදුම්කරුවන්ගෙන් බහුතරය **"රිච් කුකීස්"**හි අභ්‍යන්තර හා බාහිර ව්‍යාපාරික පරිසරය පිළිබඳව ලියා තිබුණ නමුත් ව්‍යාපාරික පරිසරය නිසි ලෙස පැහැදිලි කර තිබුණේ නැත. එබැවින් ඔවුන්ට සම්පූර්ණ ලකුණු ලබා ගැනීමට හැකිවූයේ නැත.

**B කොටස** **"රිච් කුකීස්"**ආයතනයට අදාල SWOT විග්‍රහය පිළිබඳ දැනුම පරීක්ෂා කිරීම මෙම ප්‍රශ්නයෙන් අපේක්ෂා කරන ලදී. සැලකිය යුතු තරම් අයදුම්කරුවන් පිරිසක් නිසි ලෙස SWOT විග්‍රහය හඳුනාගෙන තිබුණේය. සමහරු SWOT වෙනුවට PESTEL විග්‍රහය සිදුකර තිබුණි.

**C කොටස** **"රිච් කුකීස්"** ආයතනය විසින් බෙදා හැරීමේ මාධ්‍ය පිළිබඳව සලකා බැලිය යුතු සාධක සඳහන් කිරීම අවශ්‍ය කර ඇත. සැලකිය යුතු අයදුම්කරුවන් පිරිසක් හොඳින් උත්තර සපයා සම්පූර්ණ ලකුණු උපයාගෙන ඇත.

එහෙත් සමහරු ප්‍රශ්නය වරදවා වටහාගෙන තිබුණි.

**D කොටස** මෙම කොටසින් ශ්‍රී ලංකාවේ සුළු හා මධ්‍යම පරිමාණයේ ව්‍යවසායකයන් මුහුණුදෙන අභියෝග පරීක්ෂාවට ලක්කර ඇත. බහුතරයක් අයදුම්කරුවන් ඔවුන්ගේ සාමාන්‍ය දැනීම තුළින් සම්පූර්ණ ලකුණු උපයාගෙන තිබුණේය.

**E කොටස** මෙම කොටසින් **"රිච් කුකීස්"** ආයතනයට පාරිසරික තිරසාරත්වය ළඟා කර ගැනීමට සහය විය හැකි ආකාර පරීක්ෂාවට ලක් කර ඇත. සැලකිය යුතු අයදුම්කරුවන් ගණනක් ප්‍රශ්නය අවබෝධ කරගෙන නොතිබූ අතර ඔවුන් අවිනිශ්චිත උත්තර ලියා තිබුණේය. ඔවුන් තම සාමාන්‍ය දැනුම භාවිත කර පැහැදිලි කිරීම් කර තිබුණේය.

\- - -

## අයදුම්කරුවන්ගේ අවබෝධ කර ගැනීමේ මට්ටම සහ කාර්යසාධනය වැඩිදියුණු කර ගැනීම සඳහා සැළකිල්ලට ගතයුතු පොදු කරුණු:

(1) ප්‍රශ්ණ පත්‍රය ලැබුණු පසු එහි දී ඇති උපදෙස් පරීක්ෂාකාරීව කියවීම. (ඒ සඳහා අමතර කියවීමේ කාලය ප්‍රයෝජනයට ගත හැක).

(2) AAT විෂය නිර්දේශය/පාඩම් මාලාව මුළුමනින්ම අධ්‍යනය කිරීම.

(3) අයදුම්කරුවන් අවධානයෙන් ප්‍රශ්නය කීප වතාවක් කියවා, ලිවිය යුත්තේ කුමක්ද යන්න අවබෝධ කරගත යුතුය. ප්‍රශ්නය සඳහා ඍජු කෙටි උත්තර අපේක්ෂා කර තිබෙන විට අනවශ්‍ය පැහැදිලි කිරීම් සහ විස්තර නොලිවිය යුතුය.

(4) විභාගයේදී කාර්යක්ෂම ලෙස කාලය කළමණාකරණය කරගත යුතුය.

(5) පිළිතුරු සැපයීම එක් භාෂාවකින් පමණක් විය යුතුය. එය විභාගය සඳහා අයදුම් කල භාෂාවයි. සෑම නව ප්‍රශ්නයක් සඳහාම පිළිතුරු සැපයීම ආරම්භ කලයුත්තේ පිළිතුරු පොතේ අළුත් පිටුවකය. අත් අකුරු කියවිය හැකි මට්ටමක තිබීම හා උත්තර වලට ප්‍රශ්න අංක නිසිලෙස යොදා තිබිම ගැන සැළකිලිමත් විය යුතුය.

(6) උත්තර පත බාරදීමට පෙර සෑම පිටුවකම ප්‍රශ්න අංක සහ විභාග අංකය නිවැරදිව ලියා තිබේදැයි දෙවරක් පරීක්ෂා කරන්න.

(7) ''කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව'' ප්‍රශ්න පත්‍රයටම අමුණා ඇත. වාස්තවික ප්‍රශ්න හැර අන් සෑම ප්‍රශ්නයක්ම කළයුතු ක්‍රියාවකින් යුක්ත වේ. එහිදි දී ඇති අර්ථකථනවලට අනුකූල වෙමින් උත්තර ලියන්න.

(8) දැනුම වැඩිදියුණු කරගැනීමට, පසුගිය විභාගවල ප්‍රශ්න පත්‍ර අධ්‍යයනය කර උත්තර ලියා පුහුණු විය යුතුය.

(9) ඒඒටි ආයතනය මඟින් නිකුත් කරන ස්ව-අධ්‍යයන පාඩම්මාලා (Self-study Text) පොත්, යෝජිත උත්තර, ලිපි, සඟරා ආදිය කියවීම අනිවාර්යයෙන්ම කළ යුතුය.

(10) කිසිදු ප්‍රශ්නයක් මගහැරීම නොකලයුතුය. මෙම පුරුද්ද විභාගය අසමත් වීමට හේතුවක් විය හැක.

(11) හොඳ සූදානමකින් සහ විභාගය සමත්වීමේ පරම චේතනාව පෙරටුකොටෙගන විභාගයට මුහුණ දීය යුතුය.

- * * * -